| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.10.24 පැය 1455 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1937/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය සහ සමාජ මාධ්‍ය ඔස්සේ සංසරණය වන පුවතක් සම්බන්ධව කරුණු පැහැදිලි කිරීම.**

කතරගම කිරිවෙහෙර පුරාණ විහාරස්ථානයේ නායක ස්වාමීන් වහන්සේ වන කොඹවක ධම්මින්ද ස්වාමීන්වහන්සේගේ පොලිස් ආරක්ෂාව ඉවත් කර ඇති බවට විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය සහ සමාජ මාධ්‍ය ඔස්සේ ද සංසරණය වන පුවතක් පිළිබඳව කරුණු පැහැදිලි කරමින් මාතර සහ හම්බන්තොට දිසාව භාර නියෝජ්‍ය පොලිස්පතිවරයා විසින් වාර්තාවක් යොමු කර ඇත.

එම වාර්තාව අනුව කතරගම මහා දේවාල පරිශ්‍රය තුළ, අෂ්ඨඵල බෝධීන් වහන්සේ මෙන්ම කතරගම කිරිවෙහෙර සහ අනෙකුත් දේවාල පිහිටා ඇති අතර මෙම පරිශ්‍රයේ ආරක්ෂාව සඳහා පැය 24 ම ආවරණය වන පරිදි පොලිස් නිලධාරීන් 16 දෙනෙකු හා සිවිල් ආරක්ෂක බලකා නිලධාරියෙකුද යොදවා ඇති බවත්, කිරිවෙහෙර පුරාණ විහාරස්ථානයේ නායක ස්වාමීන්වහන්සේගේ ආරක්ෂාව සඳහා 2018 වර්ෂයේ සිට දේවාල මුරපොළ වෙත අනුයුක්ත කර සිටින නිලධාරීන් 17 දෙනෙකුගෙන් පොලිස් නිලධාරීන් දෙදෙනෙකු පැය 24 ම ආවරණය වන පරිදි රාජකාරි යොදවා ඇති බවටත් දන්වා ඇත.

මීට අමතරව කතරගම දේවාල පරිශ්‍රය තුල යුද හමුදා අනුකණ්ඩයක් ස්ථාපිත කර ඇති අතර එම යුද හමුදා අනුකණ්ඩයෙන්ද කතරගම කිරිවෙහෙර පුරාණ විහාරස්ථානයේ නායක ස්වාමීන් වහන්සේගේ ආරක්ෂාව සඳහා යොදවනු ලබයි.

ඒ අනුව, කතරගම කිරිවෙහෙර පුරාණ විහාරස්ථානයේ නායක ස්වාමීන් වහන්සේ වන කොඹවක ධම්මින්ද ස්වාමීන්වහන්සේගේ ආරක්ෂාව හෝ පුද්ගලිකව ආරක්ෂාව ඉවත් කර ඇති බවට විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ඇතුළු සමාජ මාධ්‍ය ඔස්සේ සංසරණය වන පුවත අසත්‍ය පුවතක් බවටත් නියෝජ්‍ය පොලිස්පති මාතර සහ හම්බන්තොට දිසාව විසින් වැඩිදුරටත් වාර්තා කර ඇත.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**